# <u>උපාය මර්ගික සැලැස්ම   2020-2025</u>

දැක්ම - සෞභාග්‍යමත් දේශයක් උදෙසා ජනතාවට විශිෂ්ට සේවයක් සැපයීම

මෙහෙවර - රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව කොට්ඨාශයේ තිරසාර සංවර්ධනය සඳහා මානව හා භෞතික සම්පත් සඵලදායිව භාවිතයෙන් හා සම්බන්ධිකරණය කිරීමෙන් සියළුම පාර්ශවයන් වෙත E රාජ්‍ය සේවාවන්ද ඇතුළුව විශිෂ්ට සේවාවන් සැලසීම.

**තත්ත්ව විශ්ලේශනය**

**ශක්තීන්**

1. ප්‍රමාණවත් මානව සම්පතක් තිබීම.
2. මානව සම්පත සතු සුවිශේෂි කුසලතාවන්.
3. ආගමික නායකයින් , ප්‍රජා නායකයින් හා ප්‍රජාවගේ පහසුව පරිදි කාර්යාලය පද්ධතිය ස්ථානගත විම.
4. කොට්ඨාසයේ ප්‍රධානතම පරිපාලන ආයතනය වීම.

**දූර්වලතාවන්**

1. ප්‍රමාණවත් ඉඩපහසුකම් සහිත ගොඩනැගිලි නොමැති වීම.
2. නවක නිලධාරීන්ට ප්‍රමාණවත් මේස, පුටු සහ අනිකුත් උපකරණ පහසුකම් නොමැති වීම.
3. පවතින පරිගණක ජාලය තුළින් අපේක්ෂිත කාර්යයන් ඉටුකරගැනීමේදී අපහසුතා පැවතීම.
4. පරිගනක, මුද්‍රණ යන්ත්‍ර වැනි උපකරණ ප්‍රමාණවත් තරම් ආයතනය සතු නොවීම.
5. අන්තර් ජාල සංඥා පහසුකම් දූර්වල මට්ටමක පැවතිම.
6. නාගරිකව ඇති ග්‍රාම නිලධාරී වසම් වල ජනතාවට ලගාවීමට ඇති අපහසුව.
7. සේවා සපයන ක්‍රමවේද වල පවතින දූර්වලතා.

**අවස්ථා**

1. කෘෂිකාර්මික හා ස්වභාව සෞන්දර්යයෙන් යුත් නිසංසල පරිසරයක පැවතීම.
2. දිස්ත්‍රික්කයේ ප්‍රධානම පරිපාලන ඒකකයට ආසන්නව පැවතීම.
3. ඉහල නිලධාරින්ගේ හා දේශපාලන නායකත්වයේ සහයෝගය ලැබීම.
4. ප්‍රජාවගේ සහයෝගය ලැබීම.
5. අනෙකුත් බාහිර ආයතන සමග මනා සම්බන්ධතාවක් පැවතීම.
6. කෘෂිකර්මාන්තය සඳහා සුදුසු පාරිසරික තත්ත්වයන් යහපත්ව පැවතීම.
7. කොට්ඨාසය තුළ මාර්ග පද්ධතිය හොඳ මට්ටමක පැවතීම.
8. කොට්ඨාසයේ ප්‍රජාව ඉහළ සාක්ෂරතාවයෙන් යුත්ත වීම.
9. විවිධ රාජ්‍ය ආයතන වල සහයෝගය ලැබීම.
10. ශත්තිමත් ප්‍රජා පාදක සංවිධාන පද්ධතියක් තිබීම හා නිරන්තර සහයෝගය ලැබීම. උදා - ශාසනාරක්ෂක බල මණ්ඩලය,සංස්කෘතික බලමණ්ඩලය,වැඩිහිටි බල මණ්ඩල,සමථ මණ්ඩලය
11. විදුලිය,ජලය වැනි යටිතල පහසුකම් ඉහළ මට්ටමක පැවතීම.
12. ස්වභාවික ව්‍යසන අවම මට්ටමක පැවතීම.

**තර්ජන**

1. ප්‍රධාන මාර්ගයක නොපිහිටි නිසා කාර්යාල නිලධාරීන්ට සේවයට වාර්ථා කිරීමේදී පොදු ප්‍රවාහන සේවාවල අපහසුතා පැවතීම.
2. විශාලම පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටීම නිසා ප්‍රමානවත් තරම් ප්‍රතිපාදන නොලැබීම.
3. යක්දෙස්සාගල වන රක්ෂිතය ආසන්නව පැවතීම නිසා නාය යාම් අවදානම හා රිළව් වැනි වන සතුන්ගෙන් කාර්යාලීය පරිසරයට සිදුවන හානිය.
4. ප්‍රධාන රාජ්‍ය හා වාණිජ ආයතනයන්ගෙන් දුරස්ථව හුදෙකලාව පිහිටීම.
5. කොට්ඨාසයේ කෘෂිකාර්මික කටයුතු සඳහා වන සතුන්ගෙන් වන හානි උදා - රිළවු,මයිටා, වඳුරන් වැනි.
6. සමහර ග්‍රාම නිලධාරී වසම් වල මත්පැන් මත්ද්‍රව්‍ය උවදුර පාලනය කල නොහැකි තත්ත්වයක පැවතීම.
7. හඳුනාගත් ග්‍රාම නිලධාරී වසම් වල ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය හා ආගමික සාමාජීය ගැටළු මත විවිධ වැඩසටහන් සඳහා වන ප්‍රජා සහභාගීත්වය අඩුවීම.
8. තිරසර පරිසර කටයුතු පිලිබඳව ජනතාවගේ දැනුම ආකල්ප හා පුරුදු යහපත් නොවීම.
9. කෘෂිකාර්මික කටයුතු වලදී රසායනික තෙල් පොහොර භාවිතය ඉහළ මට්ටමක පැවතීම.

**දිගකාලීන අරමුණු**

1. කොට්ඨාශයේ ජනතාවගේ භෞතික යටිතල පහසුකම් ප්‍රමාණවත්ව හා තිරසාරව ගොඩනැගීම
2. ජාතික ආර්ථිකයට ඉහල මට්ටමේ දායකත්වයක් ලබා දෙන මානව සම්පත් කොට්ඨාශය තුල ගොඩ නැංවීම .
3. සමාජීය හා අධ්‍යාත්මික සංවර්ධනය තුලින් වඩා ඉහල මට්ටමේ ප්‍රජාවක් නිර්මාණය කිරීම
4. තිරසාර පරිසර පද්ධතියක් ගොඩ නැංවීම තුලින් කොට්ඨාශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීම.
5. තිරසාර ජීවනෝපාය මාර්ගයක් ඇති කිරීම සහ ප්‍රවර්ධනය තුලින් කොට්ඨාශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ගොඩනැවිම.

**අරමුණු 01 - උපාය මාර්ග**

1. ජාතික ප්‍රමිතීන් හා නිර්ණායක මත පදනම් භෞතික - යටිතල පසුකම් සංවර්ධන වැඩසටහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම , මෙහෙයුම් කරණය හා ඇගයීම.
2. තිරසාර භෞතික යටිතල පහසුකම් සංවර්ධනය පිලිබඳ කාර්යාලයේ මානව සම්පත පුහුණු කිරීම හා දැනුවත් කිරීම.
3. විගණන ප්‍රමිතීන් හා නිර්දේශ සැලකිල්ලට ගනිමින් භෞතික යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කිරීම.

**අරමුණු 02 - උපාය මාර්ග**

1. කොට්ඨාශයේ මානව සම්පත පිලිබද නිවැරදි දත්ත හා තොරතුරු පවත්වාගෙන යාම හා ප්‍රතිපත්ති සම්පාදනය ( පරිගණක දත්ත පද්ධති හරහා)
2. දත්ත හා තොරතුරු මත පදනම කරගත් මානව සම්පත් තීරණ හා ප්‍රතිපත්ති පිලියෙල කිරීම.
3. කාර්යයක්ෂම හා ඵලදායි මානව සම්පත් උපයෝජන වැඩසටහන් දියත් කිරීම (තාක්ෂණය හා නව්‍යකරණය මත පදනම්ව )
4. පුහුණු අවශ්‍යතා මත පදනම්ව වෘත්තීය පුහුණු වැඩසටහන් හා වෘත්තීය මාර්ගෝපදේශනය සැලසීම (වෘත්තීය පුහුණු ආයතන සමග සම්බන්ධීකරණය)

**අරමුණු 03 - උපාය මාර්ග**

1. ක්ෂේත්‍ර නිලධාරින් හරහා ඉලක්කගත සමාජීය හා අධ්‍යාත්මික සංවර්ධන ක්‍රියාකාරකම් අඛණ්ඩව දියත් කිරිම.
2. ඉහත ක්‍රියාකාරම් හි ප්‍රගතිය නියාමනය සහ දත්ත හා තොරතුරු පවත්වාගෙන යාම.
3. ආගමික හා ප්‍රජා සංවිධාන නායකත්වය සමග ඉහල මහජන සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම.
4. සාමාජීය ගැටළු පිලිබදව නිරන්තර විධිමත් හා අවිධිමත් සමීක්ෂණ , පර්යේෂණ දියත් කිරිම.

**අරමුණු 04 - උපාය මාර්ග**

1. ජාතික හා පලාත් පරිසර නීතිරීතීන්ට අනුකූව කොට්ඨාශයයේ පරිසර කටයුතු නියාමනය හා ප්‍රවර්ධනය කිරීම.
2. තොරතුර තාක්ෂණය ආශ්‍රිත (GIS) පරිසර පද්ධතිය නියාමන තොරතුර පද්ධතියක් සකස් කිරීම . (ඉඩම පරිහරණ සැලසුම)
3. කොට්ඨාශයේ ජනතාවගේ ආර්ථික හා කෘෂිකාර්මික කටයුතු වලදී තිරසාර කෘෂිකර්මය කෙරෙහි නැඹුර කිරීම හා ප්‍රවර්ධනය.

**අරමුණු 05 - උපාය මාර්ග**

1. තිරසර කෘෂිකර්මාන්තය (Eco Agriculture) සදහා ප්‍රදේශයේ ගොවියන් නැඹුරු කිරීමේ දැනුවත් කිරීම් හා ප්‍රචාරන ක්‍රම ක්‍රියාත්මක කිරීම.
2. ආදර්ශ බෝග වගාවන් හදුනා ගැනිම හා ප්‍රවර්ධනය
3. තිරසර කෘෂි වගාකරුවන් සදහා “ වගා තරග ” සංවිධානය කිරීම
4. කොට්ඨාශය සදහා තිරසර කාර්මික ප්‍රතිපත්තීන් හදුන්වා දීම හා නියාමනය.
5. කොට්ඨාශයේ සේවා කර්මාන්තය සදහා ප්‍රමිති කොන්දේසි හදුන්වා දීම හා නියාමනය කිරීම.